# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2084/4 - 2018 අගෝස්තු මස 14 වැනි අඟහරුවාදා - 2018.08.14

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරිය පනත**

3 වැනි වගන්තිය යටතේ නියෝග

1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරිය පනතේ 3 වැනි වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර මහා නගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍ය පාඨලී චම්පික රණවක වන මම, මෙහි දෙවන උප ලේඛනයේ I තීරුවෙහි නිශ්චිතව දක්වා ඇත්තාවූද, එම උප ලේඛනයෙහි II තීරුවෙහි අනුරූප සටහනෙහි සඳහන් මායිම් හා ඉම් සලකුණු නිශ්චිතව දක්වා ඇත්තා වූ ද එහෙත් පළමු උප ලේඛනය මගින් ප්‍රකාශ කරන දැනටමත් සංවර්ධන ප්‍රදේශ ලෙස හඳුනාගත් ප්‍රදේශ හැර, ප්‍රදේශය සංවර්ධනය කිරීම සඳහා සුදුසු බැව් මාගේ මතය වන හෙයින්, ඒ ප්‍රදේශය ඒ වගන්තියේ කාර්යය සඳහා නාගරික සංවර්ධන ප්‍රදේශයක් විය යුතු යැයි මෙම නියමයෙන් ප්‍රකාශ කරමි.

පාඨලී චම්පික රණවක (පා.ම.),
මහා නගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍ය.

2018 ජූලි මස 30 වැනි දින,
17 හා 18 වන මහල,
''සුහුරුපාය'' ශ්‍රී සුභූතිපුර පාර,
බත්තරමුල්ල,
මහා නගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශයේ දී ය.

**පළමුවැනි උපලේඛනය**

දෙවන උප ලේඛනයේ I වන හා II වන තීරුවෙහි සඳහන් ඉම් හා මායිම් වලින් යුක්ත ප්‍රදේශයට අයත්, දැනටමත් 1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරි පනත යටතේ සංවර්ධන ප්‍රදේශ වශයෙන් ශ්‍රී ලංකා ජනරජයේ පහත සඳහන් *අති විශෙෂ ගැසට්* නිවේදනය මගින් ප්‍රකාශයට පත් කළා වූ :

* 1979 ජූනි මස 01 වැනි සිකුරාදා අංක 38/16 දරන *අති විශෙෂ ගැසට් පත්‍රය* මගින් ප්‍රකාශයට පත් කළා වූ පොළොන්නරුව සුළු නගර සභා සීමාව,

* 2005 ජූනි මස 13 වැනි සඳුදා අංක 1397/1 දරන *අති විශෙෂ ගැසට් පත්‍රය* මගින් ප්‍රකාශයට පත් කළා වූ තමන්කඩුව නාගරික සංවර්ධන ප්‍රදේශය

**දෙවන උපලේඛනය**

*I වැනි තීරය*

II වැනි තීරුවෙහි විස්තර වන ඉම් හා මායිම් වලින් යුක්ත උතුරුමැද පළාතේ, පොළොන්නරුව දිස්ත්‍රික්කයේ තමන්කඩුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ පිහිටි බැදිවැව (153), සමුද්‍රගම (154), ඇතුමල්පිටිය (155), සිරිසඟබෝ පෙදෙස (155 A), අලුත්වැව නැගෙනහිර (159), අලුත්වැව බටහිර (160), ගණන්ගොල්ල (161), වීරපෙදෙස (162), පුලස්ති පෙදෙස (163), පොත්ගුල් පෙදෙස (167), උඩවෙල (168), මහවැලි පෙදෙස (169), නිශ්ශංකමල්ල පෙදෙස (170), තෝපාවැව (171), පොළොන්නරුව නගරය (172), පලුගස්දමන 1 ඇළ (173), පලුගස්දමන 2 ඇළ (174), පලුගස්දමන උතුර (176), පලුගස්දමන දකුණ (177), ගල්තඹරාව (178), කුරුප්පු හංදිය (179), මහසෙන් පෙදෙස (180), මානික්කම්පට්ටිය (181), නෙළුම්විල (182), කඳුරුවෙල බටහිර (183), කඳුරුවෙල දකුණ (184), පැරකුම් පෙදෙස (185), කඳුරුවෙල නැගෙනහිර (186), ගල්ලැල්ල නැගෙනහිර (187), ගල්ලැල්ල බටහිර (188), කොටලීය (189), ලක්ෂඋයන (198), නිශ්ශංකමල්ලපුර (199), සේවාගම (200) යන ග්‍රාම නිලධාරී කොට්ඨාස වලින් සමන්විත වූ මුළු මහත්භූමි ප්‍රදේශය.

*II වැනි තීරුව*

***ඉම් සහ මායිම්***

*උතුරට :-*

අංක 198, ලක්ෂඋයන ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ බටහිර හා වයඹ මායිම් හමුවන ලක්ෂ යේ සිට එම අංක 198 ලක්ෂ උයන ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ වයඹ මායිම ඔස්සේ ඊශාන දෙසටද, උතුරු මායිම ඔස්සේ නැගෙනහිර දෙසටද, ඊශාන මායිම ඔස්සේ ගිණිකොන දෙසට හා උතුරු මායිම ඔස්සේ නැගෙනහිර දෙසට අංක 200 සේවාගම ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ බටහිර මායිම හමුවන තෙක්ද, එතැන් සිට එම අංක 200 සේවාගම ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ වයඹ මායිම ඔස්සේ උතුරු කෙළවර දක්වා ඊශාන දෙසට අඳින ලද රේඛාව.

*නැගෙනහිරට :-*

අවසන් වරට සඳහන් කරන ලද ලක්ෂයේ සිට අංක 200 සේවාගම ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ නැගෙනහිර මායිම ඔස්සේ දකුණු දෙසට හා ඊශාන දෙසට එම ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ ඊශාන දිග කෙළවර දක්වා ද, එතැන් සිට එම අංක 200 සේවාගම ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ නැගෙනහිර මායිම ඔස්සේ දකුණු දෙසට අංක 174 පලුගස්දමන 2 ඇළ ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ උතුරු මායිම හමුවන තෙක්ද, එතැන්සිට එම පලුගස්දමන 2 ඇළ ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ උතුරු මායිම ඔස්සේ නැගෙනහිර දෙසට සහ එතැන් සිට එම ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ නැගෙනහිර මායිම ඔස්සේ දකුණු දෙසට සහ එතැන් සිට 174 ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ දකුණු මායිම ඔස්සේ බටහිර දෙසට අංක 186 කඳුරුවෙල නැගෙනහිර ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ නැගෙනහිර මායම තෙක්ද, එතැන් සිට අංක 186 කඳුරුවෙල නැගෙනහිර, අංක 184 කඳුරුවෙල දකුණ, අංක 181 මාණික්කම් පට්ටිය හා අංක 187 ගල්ලැල්ල නැගෙනහිර ග්‍රාම නිලධාරී කොට්ඨාසවල නැගෙනහිර හා උතුරු මායිම් ඔස්සේ ගිනිකොණ, නැගෙනහිර, ඊශාන හා ගිණිකොණ දෙසට ගල්ලැල්ල නැගෙනහිර ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ නැගෙනහිර කෙළවර දක්වාද, එතැන් සිට එම ගල්ලැල්ල නැගෙනහිර ග්‍රාම නිලධාරී කොට්ඨාසය සහ අංක 189 කොටලීය ග්‍රාම නිලධාරී කොට්ඨාසවල නැගෙනහිර මායිම ඔස්සේ (මහවැලි ගඟ මධ්‍ය රේඛාව ඔස්සේ) දකුණු දෙසට අංක 189 කොටලීය ග්‍රාමනිලධාරී කොට්ඨාසයේ ගිනිකොණ දිග කෙළවර දක්වා අඳින ලද රේඛාව.

*දකුණට :-*

අවසන් වරට සඳහන් කරන ලද ලක්ෂ යේ සිට අංක 189 කොටලීය හා අංක 160 අලුත්වැව බටහිර ග්‍රාම නිලධාරි කොට්ඨාසවල දකුණ මායිම ඔස්සේ (අඹන්ගඟ මධ්‍ය රේඛාව ඔස්සේ) අලුත්වැව බටහිර ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ නිරිතදිග කෙළවර හමුවන තෙක් බස්නාහිර දෙසට අඳින ලද රේඛාව.

**දෙවන උප ලේඛනය** (සම්බන්ධිතයි)

| *I වැනි තීරය* | *II වැනි තීරය* |
| --- | --- |
| | *බටහිරට :-* |
| | අවසන් වරට සඳහන් කරන ලද ලක්ෂ යේ සිට අංක 160 අලුත්වැව බටහිර, අංක 161 ගණන්ගොල්ල, අංක 167 පොත්ගුල් පෙදෙස හා අංක 171 තෝපාවැව ග්‍රාම නිලධාරී කොට්ඨාසවල බටහිර, දකුණු හා බටහිර මායිම ඔස්සේ උතුර, බටහිර, උතුර, දකුණ හා උතුරු දිශාවට අංක 153 බැඳිවැව ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ දකුණු මායිම හමුවන තෙක්ද එතැන් සිට අංක 153 බැඳිවැව හා අංක 154 සමුද්‍රගම ග්‍රාම නිලධාරී කොට්ඨාසවල දකුණු හා බටහිර මායිම් ඔස්සේ උතුරට, දකුණට, උතුරට, දකුණට, උතුරට, දකුණට හා උතුරු දිශාවට අංක 155 A සිරිසඟබෝ පෙදෙස ග්‍රාමනිලධාරී කොට්ඨාසයේ බටහිර මායිම හමුවන තෙක්ද, එතැන් සිට එම අංක 155 A සිරිසඟබෝ පෙදෙස ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ බටහිර මායිම ඔස්සේ ඊසාන දෙසට අංක 155 ඇතුමල්පිටිය ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ බටහිර මායිම හමුවන තෙක්ද, එතැන් සිට එම අංක 155 ඇතුමල්පිටිය ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ බටහිර හා උතුරු මායිම් ඔස්සේ උතුරට හා නැගෙනහිර දෙසට අංක 198 ලක්ෂ උයන ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ බටහිර මායිම හමුවන තෙක්ද, එතැන් සිට එම අංක 198 ලක්ෂඋයන ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ බටහිර මායිම ඔස්සේ උතුරු දිශාවට ආරම්භක ලක්ෂ්‍යය හමුවන තෙක් ද වේ. |

08 - 990

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.